# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1487/7 – 2007 මාර්තු 05 වැනි සඳුදා– 2007.03.05

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 17 වගන්තිය සමඟ කියවෙන පනතේ 212 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද රෙගුලාසි.

රංජිත් සියඹලාපිටිය,
*වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.*

2007 මාර්තු 01 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

රෙගුලාසි

1. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 17 (2) (ආ) වගන්තියේ කාර්යයන් සඳහා නිශ්චිත ව්‍යවසාය යන්න යම් සමාගමකට අදාළව යොදවන විට එයින් ඒ සමාගම විසින් කරගෙන යන්නාවූ ද, ඒ සමාගම යෙදී සිටින්නා වූ ද,

(අ) මෙම රෙගුලාසිවල උපලේඛනයෙහි නාමෝපගත කර ඇති ව්‍යාපෘතියක් ;

(ආ) ආයෝජනය කළ මුදල රුපියල් මිලියන දෙසිය පනහට වැඩිවන යම් ව්‍යාපෘතියක් ; සහ

ඉහත කවර අවස්ථාවක දී වුව ද, 2, 3 සහ 4 රෙගුලාසිවලට අනුගත වන ව්‍යාපෘතියක් අදහස් කෙරේ.

2. කලින් පැවති කිසියම් ව්‍යාපාරයක්/ව්‍යාපාර බෙදීමෙන්, ඒකාබද්ධ කිරීමෙන් හෝ ප්‍රතිසංස්ථාපනය කිරීම මගින් පිහිටුවනු ලැබූ ව්‍යවසායක් නොවිය යුතුය.

3. සමාගම විසින් නියමිත ව්‍යවසායෙහි ආයෝජනය කර ඇති මුදල පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන ලෙස සාක්ෂි සමාගම විසින් ඉදිරිපත් කළ යුතුය.

4. සමාගම විසින් නිශ්චිත ව්‍යවසායෙහි ආයෝජනය කර ඇති මුදල එකී සමාගම 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 17 වගන්තිය මගින් ලබා දී ඇති බදු නිදහස් කාලය තුළ දී සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් ආපසු ගැනීම හෝ අඩුකිරීම නොකළ යුතුය.

5. සමාගමක් 2, 3 හෝ 4 රෙගුලාසිවලට අනුකූලතාව දැක්වීමට ආපොහොසත් වන අවස්ථාවක දී ව්‍යාවසාය වාණිජමය මෙහෙයුම් කිරීම ආරම්භ කළ තක්සේරු වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි එම සමාගමේ ලාභ සහ ආදායම, ආදායම් බද්දට යටත් විය යුත්තේය.

6. ඉහත කවර රෙගුලාසියක කාර්යයන් සඳහා "ආයෝජනය" යන්නෙන් අදහස් කෙරෙනුයේ ස්කන්ධ මුදල හෝ ණය මගින් අරමුදල් සපයන ලද ව්‍යාවසායෙහි සම්පූර්ණ පිරිවැය වේ.

උපලේඛනය

*නාමෝපගත ව්‍යාපෘති*

- පිඟන් මැටි භාණ්ඩ, වීදුරු භාණ්ඩ හෝ වෙනත් ඛණිජ පාදක නිෂ්පාදන නිපදවීමේ යෙදී සිටින ව්‍යාපෘතියක්.

- රබර් පාදක භාණ්ඩ නිපදවීම.

- කිසියම් ලුහු හෝ බර ඉංජිනේරු කර්මාන්ත ව්‍යාපෘතියක්.

- ශීතකරණ සහිත ප්‍රවාහන සේවා හෝ ශීත කාමර ගබඩා සේවා සැපයීමේ නිරත කිසියම් ව්‍යාපෘතියක්.

- 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ (17) (3) වගන්තියේ විග්‍රහ කර ඇති පරිදි අපනයන නිෂ්පාදන ග්‍රාම සමාගමක්.

- විදේශීය රටක කිසියම් කටයුත්තකට සම්බන්ධ කිසියම් වෙරළබඩ සමාගමක් පාලනය කිරීම හෝ උපස්ථ කාර්යාලයක් පවත්වාගෙන යාම.

03-601

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.